(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1999 අංක 12 දරන ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **1999** මැයි මස **24** වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


1999 මැයි මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. **15.75** තැපැල් ගාස්තුව : රු. **5.25**

**1999 අංක 12 දරන ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 මැයි මස 24 වැනි දින.]

එල්. ඩී.–ඕ. 74/88.

## 1972 අංක 16 දරන ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

වෙනත් කරුණු අතර, ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය විසින් රැකියා ඇති කිරීමේ ද, සංගමයේ ශුභ සාධක වැඩ පිළිවෙලවල්, ව්‍යාපෘති හා කටයුතු එමගින් ම මුදල් උත්පාදනය කර ගැනීමෙන් කර ගෙන යාමේ ද, කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත ආර්ථික හා මූල්‍ය කටයුතුවල යෙදීමට සංගමයට හැකි කිරීමෙහි ලා විධිවිධාන සැලැස්වීමට අවශ්‍යව ඇති හෙයින් ද:

එකී සංගමය විසින්, තත්කාර්ය සඳහා කැඳවනු ලැබූ විශේෂ මහා සභා රැස්වීම්වල දී පැමිණ සිටි හා ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් ඉහත සඳහන් අවශ්‍යතා පිළිබඳව, විධිවිධාන සැලැස්වීම පිණිස ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය (සංස්ථාගත කිරීමේ) පනතට අවශ්‍ය සංශෝධන කරන ලෙස ඉල්ලා ඇති හෙයින් හා ඒ සංශෝධන කිරීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ. :–

ලුහුඬු නාමය

**1**. මේ පනත 1999 අංක 12 දරන ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**2**. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1972 අංක 16 දරන ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය (සංස්ථාගත කිරීමේ) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

*(අ)* ඒ වගන්තියේ (9) වන උපවගන්තිය, එහි (15 ) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ;

*(ආ)* ඒ වගන්තියේ (10) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

*(ඇ)* ඒ වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් .

"(9) රැකියා අවස්ථා ඇති කිරීමේ සහ ශුභසාධක වැඩ පිළිවෙලවල්, ව්‍යාපෘති සහ සංස්ථාවේ ක්‍රියාකාරකම් සඳහා මුදල් උත්පාදනය කර පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා, ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත ආර්ථික හා මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම, සංවිධානය කිරීම හා ඒවායේ නිරතවීම සහ ඒ කටයුතු කර ගෙන යාම ;

(10) සර්වෝදය දර්ශනයට අනුකූලව, ජන කොටස්වල සංවර්ධනය ඇති කිරීමෙහි ලා අධ්‍යාත්මික, සදාචාරාත්මක, සමාජයීය, අධ්‍යාපනික, ආර්ථික හා මූල්‍ය කටයුතු භාර ගැනීම පිණිස නීතියෙන් පිළිගත් ප්‍රජා සංවිධාන පිහිටුවීම, නංවාලීම සහ ඒ ප්‍රජා සංවිධානවලට පුහුණු සහ කළමනාකාරීත්ව සේවාවන් ද, මුදල් ආධාර ද සැළසීමෙන් ඒවායේ සංවර්ධන කටයුතු කරගෙන යාමෙහි ලා ඒවාට සහාය වීම ;

(11) සංගමයේ විවිධ වැඩපිළිවෙලවල් සහ ව්‍යාපෘති කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන නෛතික අස්ථිත පිහිටුවීම සහ ඒ අස්ථිතවල කටයුතු කර ගෙන යාම පාලනය කිරීම සඳහා රීති සෑදීම සහ අවශ්‍ය වන පරිපාලන බලතල හා මුදල් පිළිබඳ බලතල ඒවාට පැවරීම ;

(12) සංගමය විසින් පවත්වාගෙන යාමට හෝ නිරතවීමට අදහස් කරන යම් ව්‍යාපාරයක් හෝ ගණුදෙනුවක් පවත්වා ගෙන යන හෝ එවැන්නක යෙදී සිටින යම් තැනැත්තකු, සමාගමක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් සමඟ ලාභ බෙදා ගැනීම, සම්බන්ධතා එක් කිරීම, සහයෝගීව ක්‍රියා කිරීම, හවුලේ ව්‍යාපාර කටයුතු කිරීම සහ අන්‍යෝන්‍ය සහන සැළසීම සඳහා අන්‍යාකාරයෙන් වූ වැඩ පිළිවෙලට ඇතුළත්වීම ;

(13) සෘජු ක්‍රියා මගින් ද අවිහිංසන මැදිහත්වීම්වලට සහභාගිවීමෙන් සහ සාම පා ගමන්, සාම සාකච්ඡා, සාම අධ්‍යාපන වැඩ සටහන්, සාම කඳවුරු වැනි කටයුතුවලට හෝ සර්වෝදය අහිංසාවාදී ජනතා සාම සංවිධානයක් පිහිටුවීම මගින් වෙනත් කටයුතුවලට සහභාගිවීමෙන් ද ශ්‍රී ලංකාවේ විවිධ ජනකොටස් අතර සාමය ප්‍රවර්ධනය කිරීම ;

(14) මානුෂික අයිතිවාසිකම් හා මූලික නිදහස පිළිපැදීම සම්බන්ධයෙන් විශ්ව ගරුත්වයක් ඇති කිරීම පිණිස ද ජාතික වූ හා ජාත්‍යන්තර වූ ක්‍රියාශීලී පියවර මගින් ඒ අයිතිවාසිකම් හා නිදහස විශ්වමය වශයෙන් පිළිගැනීම හා පිළිපැදීම සහතික කර ගැනීම පිණිස ද, උත්සාහ දැරීම ; *සහ*

*(ඇ)* ඒ වගන්තියේ නැවත අංක කරන ලද (15) වන උපවගන්තියෙහි "ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සාගිනි නිවීමේ ව්‍යාපාරය" යන වචන ඉවත් කොට ඒ වෙනුවට "එෆ්. ඒ. ඕ., යූ. එන්. වී." යන කෙටි යෙදුම් ආදේශ කිරීමෙන් ;".

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :– ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

*(අ)* ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "නිලධාරීන්ගෙන්" යන වචන වෙනුවට "නිලධාරි කමිටුව" යන වචන ආදේශ කිරීමෙන් ;

*(ආ)* ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "කර්තව්‍ය කිසිවක්" යන වචන වෙනුවට "කර්තව්‍ය කිසිවක් නිලධාරි කමිටුවට හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි "සංස්ථාවේ නිලධාරීන්ගේ සහ විධායක මණ්ඩලයේ වෙනත් සාමාජිකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද" යන වචන වෙනුවට "සංස්ථාවේ නිලධාරි කමිටුවේ සහ විධායක මණ්ඩලයේ වෙනත් සාමාජිකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද, සර්වෝදයට අදාළ ආර්ථික ව්‍යවසාය හා ශුභ සාධක ඒකක පිහිටුවීම සම්බන්ධයෙන් ද, නිලධාරි කමිටුවේ සංයුතිය සම්බන්ධයෙන් ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

**6**. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :–

*උපලේඛනය*

පූර්විකාව

සත්‍ය, අහිංසාව සහ ආත්මහරණය සමාජ ව්‍යුහයේ පදනම වන්නා වූ ද, අපගේ පොදු උත්සාහයේ අරමුණ සෑම දෙනාගේම සුභ සිද්ධිය එනම්, සර්වෝදය පිණිස වන්නා වූ ද, සර්වෝදය සමාජ ව්‍යුහයක් ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ වෙනත් රටවල ගොඩනැංවීමේ උත්කෘෂ්ඨ කාර්යයට අපගේ ජීවිත කැප කර සිටින අපි අන්‍යෝන්‍ය ප්‍රේමය, විශ්වාසය, සහයෝගය සහ ඵල සමසේ භුක්ති විඳීම පැවතිය යුතු එකම පවුලක සාමාජිකයන් ලෙස මෙම පරමාධ්‍යාශය කරා කටයුතු කිරීමට ප්‍රතිඥා දෙමු. එසේම අපගේ සේවා වැඩ පිළිවෙලවල්වල කාර්යක්ෂමතා අවශ්‍යතාවන් සපුරාලීමේ සහ වෙනත් සමාජ සංවිධාන සහ ආයතන සමග සම්බන්ධතා ඇති කරලීමේ කාර්යය සඳහා, ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය, යන නාමය යටතේ පහත සඳහන් රීතිවලට යටත්ව අපි සංවිධානයක් ලෙස මෙයින් සංස්ථාපිත වන්නෙමු.

ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන (සංස්ථාපිත) සංගමයේ රීති

**1 වන රීතිය - නාමය :**

සංගමයේ නාමය "ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය" විය යුතු අතර, එය මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**2 වන රීතිය - ලාංඡනය :**

පසුබිමෙහි, උදාවන හිරු සහිතව, ලා රත් පැහැති පිපිණු නෙළුම් මල සංගමයේ ලාංඡනය වන්නේ ය.

**3 වන රීතිය - ආදර්ශ පාඨය :**

"ගමින් ගමට යමින් සැමට සේවය කරමු" යන්න සංගමයේ ආදර්ශ පාඨය වන්නේ ය.

**4 වන රීතිය - ධජය :**

ධවල පසුබිමක, සංගමයේ ලාංඡනයෙන් හා ආදර්ශ පාඨයෙන් සමන්විත ධජයක් සංගමයට තිබිය යුතු ය.

**5 වන රීතිය - පොදු පරමාර්ථ :**

පහත සඳහන් පරමාර්ථ සංගමයේ පොදු පරමාර්ථ වන්නේ ය :–

(1) ගම් දියුණු කිරීමට හා ප්‍රජා ශුභ සාධන යෝජනා ක්‍රමවල නියුක්ත වීමට ස්වෙච්ඡාවෙන් ම ඉදිරිපත් වන ශ්‍රමදාන සේවක සේවිකාවන් විසින් සර්වෝදය ප්‍රතිපත්ති, දර්ශනය සහ පරමාර්ථ අවබෝධ කරගනු ලැබීම සඳහා ඔවුන්ට ශ්‍රමදාන කඳවුරු සහ වෙනත් ක්‍රියා මාර්ග මගින් ප්‍රමාණවත් අවස්ථා සහ නිසි මානසික වාතාවරණයක් සලසා දීම ;

(2) රටේ සමාජ - ආර්ථික සහ වෙනත් ගැටළු නිවැරදිව අවබෝධ කර ගැනීමට තරුණ පෙළට අවස්ථාව සලසා දීම සහ ඒවා සර්වෝදය දර්ශනයට අනුකූලව නිරාකරණය කර ගැනීමේ මාර්ග සහ ක්‍රම ඔවුන් විසින් අධ්‍යයනය කරනු ලැබීම පිණිස අධ්‍යාපන සහ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම ;

(3) කුලය, ජාතිය, ආගම සහ පක්ෂ දේශපාලනය වැනි භේදවලින් උද්ගත වන අවිශ්වාසය සහ භේද භින්න වීම මූලෝත්පාදනය කිරීමේ අදහස ඇතිව වැඩ පිළිවෙලවල් සංවිධානය කිරීම ;

(4) පරාර්ථකාමී සේවය, ආත්ම පරිත්‍යාගය, සහයෝගය, ආත්ම දමනය සහ ශ්‍රමාභිමානය යන ගුණාංග රටේ ජනතාව අතර පතළ කිරීම ;

(5) සමාජ සාධාරණත්වය, සමානාත්මතාව, ස්වකීය මාතෘ භූමිය කෙරෙහි ඇල්ම සහ ජාත්‍යන්තර සහෝදරත්වය පිළිබඳ යහපත් අදහස්, විශේෂයෙන් ම තරුණ පෙළ තුළ වර්ධනය කිරීමෙහි ලා අනුබල දීම ;

(6) නාගරික සහ ග්‍රාමීය ජනතාව අතර ආත්ම විශ්වාසය, සහයෝගීතාව සහ එක්සත්භාවය නංවාලීම සහ ඔවුන්ගේ අධ්‍යාත්මික, සදාචාරාත්මක, සමාජයීය, ආර්ථික හා අධ්‍යාපනික ජීවිතයේ සියලු අංශයන්හි සංවර්ධනයක් ඇති කරලීම පිණිස ඔවුන්ගේ සමාජ ශක්තිය උපදවීම ;

(7) ජාතික ආපදා අවස්ථාවල දී මෙන්ම ප්‍රජා සංවර්ධන සහ සමාජ සුභ සාධක වැඩ පිළිවෙලවල්වල දී ඉදිරිපත්ව ස්වෙච්ඡා සේවාවන් කිරීමට සූදානම් තරුණ කණ්ඩායම් පුහුණු කිරීම සහ සංවිධානය කිරීම ;

(8) පෙළඹවීමෙන් තොරව සිය කැමැත්තෙන් ම දානය කිරීමට කැමති කාලය, බුද්ධිය, ශක්තිය, ඉඩකඩම්, ධනය විශේෂ කුසලතා සහ තාක්ෂණ ඥානය පොදු ජනතාවගේ සම්පත් හැකි උපරිම ප්‍රමාණයෙන් එක්රැස් කර මෙහෙයවීම සහ පොදුවේ ජනතාවගේ ආර්ථික සහ සමාජ ප්‍රගතිය ඇති කිරීම පිණිස ඒවා විද්‍යාත්මක ලෙස උපයෝගී කර ගැනීම ;

(9) රැකියා අවස්ථා ඇති කිරීමේ සහ සංගමයේ සුභ සාධක වැඩ පිළිවෙලවල්, ව්‍යාපෘති හා සංස්ථාවේ ක්‍රියාකාරකම් සඳහා මුදල් උත්පාදනය කර පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව තුළ හා ඉන් පිටත ආර්ථික සහ මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීම, සංවිධානය කිරීම හා ඒවායේ නිරතවීම සහ ඒ කටයුතු කර ගෙන යාම ;

(10) සර්වෝදය දර්ශනයට අනුකූලව, ජන කොටස්වල සංවර්ධනය ඇති කිරීමෙහි ලා අධ්‍යාත්මික, සදාචාරාත්මක, සමාජයීය, අධ්‍යාපනික, ආර්ථික හා මූල්‍ය කටයුතු භාර ගැනීම පිණිස, නීතියෙන් පිළිගත් ප්‍රජා සංවිධාන පිහිටුවීම, නංවාලීම සහ ඒ ප්‍රජා සංවිධානවලට පුහුණු හා කළමනාකාරීත්ව සේවාවන් ද, මුදල් ආධාර ද සැළසීමෙන් ඒවායේ සංවර්ධන කටයුතු කර ගෙන යාමෙහි ලා ඒවාට සහාය වීම ;

(11) සංගමයේ විවිධ වැඩ පිළිවෙලවල් සහ ව්‍යාපෘති කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය වන නෛතික හා අස්ථිත පිහිටුවීම සහ ඒ අස්ථිතවල කටයුතු කර ගෙන යාම පාලනය කිරීම සඳහා රීති සෑදීම සහ අවශ්‍ය වන පරිපාලන බලතල හා මුදල් පිළිබඳ බලතල ඒවාට පැවරීම ;

(12) සංගමය විසින් පවත්වා ගෙන යාමට හෝ නිරතවීමට අදහස් කරන යම් ව්‍යාපාරයක් හෝ ගණුදෙනුවක් පවත්වා ගෙන යන හෝ එවැන්නක යෙදී සිටින යම් තැනැත්තකු, සමාගමක් හෝ වෙළඳ ව්‍යාපාරයක් සමග ලාභ බෙදා ගැනීම, සම්බන්ධතා එක් කිරීම, සහයෝගීව ක්‍රියා කිරීම, හවුලේ ව්‍යාපාර කටයුතු කිරීම, අන්‍යොන්‍ය සහන සැළසීම සඳහා වූ අන්‍යාකාරයෙන් වූ වැඩ පිළිවෙලට ඇතුළත් වීම ;

(13) ඍජු ක්‍රියා මගින්ද අවිහිංසක මැදිහත්වීම් වලට සහභාගි වීමෙන් සහ සාම පා ගමන්, සාම සාකච්ඡා, සාම අධ්‍යාපනික වැඩ සටහන්, සාම කඳවුරු වැනි කටයුතුවලට හෝ සර්වෝදය අහිංසාවාදී ජනතා සාම සංවිධානයක් පිහිටුවීම මගින් වෙනත් කටයුතුවලට සහභාගිවීමෙන් ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් අතර සාමය ප්‍රවර්ධනය කිරීම ;

(14) මානුෂික අයිතිවාසිකම් හා මූලික නිදහස් පිළිපැදීම සම්බන්ධයෙන් විශ්ව ගරුත්වයක් ඇති කිරීම පිණිස ද, ජාතික වූ හා ජාත්‍යන්තර වූ ක්‍රියාශීලි පියවර මගින් ඒ අයිතිවාසිකම් හා නිදහස විශ්වමය වශයෙන් පිළිගැනීම හා පිළිපැදීම සහතික කර ගැනීම පිණිස ද, උත්සාහ දැරීම ; *සහ*

(15) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ ආයතනවල පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා පොදුවේ සහාය වීම සහ විශේෂයෙන් ම සාගින්න, නූගත්කම සහ රෝග පීඩා අපගේ ලෝකයෙන් තුරන් කිරීම පිණිස එෆ්. ඒ. ඕ., යූ. එන්. වී. සංවිධාන, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානය, එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර හදිසි ළමා අරමුදල, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන සහ එක්සත් ජාතීන්ගේ ස්වෙච්ඡා ආයතන ආදියේ වැඩ පිළිවෙලවල්වලට සහාය වීම.

**6 වන රීතිය - පොදු ප්‍රතිපත්ති :**

සංගමයේ සාමාජිකයන් විසින් පහත සඳහන් මූලික ප්‍රතිපත්ති දහය පිළිපැදීමට උත්සාහ දැරිය යුතු ප්‍රතිපත්ති ලෙස පිළිගත යුතු ය :–

(1) සෑම අවස්ථාවල දී ම සත්‍යය, අවිහිංසාව සහ ආත්ම පරිත්‍යාගය පිළිපැදීම ;

(2) චාම් දිවි පැවැත්මක අරමුණ ක්‍රමයෙන් ඉටු කර ගැනීම ;

(3) සංගමයේ පාරිශුද්ධිය ආරක්ෂා වන පරිදි පක්ෂ දේශපාලන සම්බන්ධකම් වලින් ඈත්වීම ;

(4) රජයේ ජාතික සංවර්ධන හා සමාජ ශුභ සාධන කටයුතුවලට සහාය වීම ;

(5) පෞද්ගලික ධන හිමිකම, තරගය, වෛරය හා තෘෂ්ණාව, මුල්කොට ඇති වර්තමාන ජීවන ක්‍රමය වෙනුවට පොදු අයිතිය, සහයෝගය, දයාව සහ ආත්ම පරිත්‍යාගය මත ගොඩනැගුණු සර්වෝදය සමාජ ක්‍රමයක් අහිංසාවාදී මාර්ගයන්ගෙන් ගොඩනැංවීමට උත්සාහ දැරීම ;

(6) බුදුරජාණන් වහන්සේ, යේසුස් ක්‍රිස්තුස් වහන්සේ, මොහමඩ්තුමා ආදී ශ්‍රේෂ්ඨ ආගමික නායකයන්ගේ ඉගැන්වීම්වල සාරය ඇතුළත් “සියල්ලන්ගේ ම යහපත උදා කිරීම” හෙවත් “සර්වෝදය” යන පරමාදර්ශය සාක්ෂාත් කර ගැනීම සඳහා ධර්මාශෝක අධිරාජයා, අනගාරික ධර්මපාලතුමා, මහත්මා ගාන්ධිතුමා වැනි ශ්‍රේෂ්ඨ පුරුෂයන් කළ සේවාවන් අනුව යමින් ශ්‍රී ලංකාද්වීපයේ සංස්කෘතික උරුමයන් වූ මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණයන් ද, දානය, ප්‍රිය වචනය, අර්ථචාර්යා, සමානාත්මතා යන සතර සංග්‍රහ වස්තූන් ද, මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්යෂ්ඨාංගික මාර්ගය ද, ශ්‍රී ලංකාද්වීපය නැවත වරක් ධර්මද්වීප – ධාන්‍යාගාර අරමුණට යොමු කිරීම සඳහා උපයෝගී කර ගැනීම ;

(7) සංගමයේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා උපයෝගී කර ගන්නා මාර්ගයන් යහපත් හා පිරිසිදු ඒවා විය යුතු බව පිළිගැනීම ;

(8) සාමාජිකත්වය ලබා ඇති අය සංගමයේ ස්වකීය සාමාජිකත්වයට අදාළ කාරණාවල දී විධායක මණ්ඩලයේත්, වැඩිහිටි මණ්ඩලයේත් තීරණවලට කීකරු විය යුතු බව පිළිගැනීම සහ ඒ තීරණවලින් යම් තැනැත්තකුට සාමාජිකත්වය අහිමි බව ප්‍රකාශ වන්නේ නම්, සිය කැමැත්තෙන් ම ඉල්ලා අස්වීම තමන් ගන්නා එකම පියවර බවට ප්‍රතිඥා දීම ;

(9) සාමාජික, සදාචාරාත්මක, දේශපාලනමය හා ආර්ථික වශයෙන් සම්පූර්ණ අහිංසාවාදී විප්ලවයක් ඇති කිරීමෙහි ලා සංගමය විසින් ගත් පළමු පියවර පමණක් ශ්‍රමදානය බව අවබෝධ කර ගෙන යුක්තිය සහ සමානාත්මතාව ප්‍රධාන ලක්ෂණය කොට ඇති මිනිසා, මිනිසා විසින් ම සූරා කනු ලබන කවර අන්දමේ හෝ පෙළීම්වලින් මිදුනු සර්වෝදය සමාජ ක්‍රමයක් බිහිකිරීම සඳහා කාලෝචිතව ගන්නා සෙසු සර්වෝදය පියවර සහ ක්‍රියාමාර්ග ගැන සැලකිලිමත්ව සේවය කිරීම ; *සහ*

(10) විද්‍යාඥානය හා ආධ්‍යාත්මික ගුණ වගාව සියල්ලන්ගේ සහපත පිණිස සමතුලිත ලෙස එක්වන පරිද්දෙන් ආත්ම ශක්තියෙන් යුත් ග්‍රාමීය හා නාගරික ප්‍රජාවන් ලෙස ජනතාව රටවල් තුළ අහිංසාවාදීව සංවිධානය වූ විට සහ එකී ප්‍රජාවන්ගෙන් සමන්විත ලෝක ජනතාව, සාමය, සහයෝගය සහ එකී ස්වාධීන ප්‍රජාවන්ගේ නිදහස කෙරෙහි ඇති අන්‍යෝන්‍ය භක්තිය වැදගත් ලක්ෂණ කොටගත් නිදහස් ජාතීන්ගේ පොදු රාජ්‍ය මණ්ඩලයක් ලෙස සංවිධානය වූ විට පමණක් මනුෂ්‍ය සංහතියේ උපරිම සතුට හා මනා පැවැත්ම ඇති වන බව අවබෝධ කර ගෙන ඒ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වැර වැඩීම.

**7 වන රීතිය - ප්‍රතිඥාව :**

(1) සංගමයේ සාමාජිකත්වය ඉල්ලුම් කරන සෑම දෙනා විසින් ම පහත සඳහන් ප්‍රතිඥාව දිය යුතු අතර, සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී ම සාමාජිකයන් විසින් සාමූහිකව මේ ප්‍රතිඥාව අලුත් කරගත යුතුය :

එසේ වුවද, (123 වන අධිකාරය වූ) සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කර ඇති සර්වෝදය ශ්‍රමදාන සමිතියක්, සර්වෝදය සමිතියක්, සර්වෝදය සංසදයක් වන සංස්ථාපිත සාමාජිකයකු සම්බන්ධයෙන් වන අවස්ථාවක එම ප්‍රතිඥාව එවැනි සමිතියක්/ සංසදයක් වෙනුවෙන් එහි සභාපති/ප්‍රධාන ලේකම් විසින් දෙනු ලැබිය යුතු ය.

(2) "ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයේ පරමාර්ථ හා ප්‍රතිපත්තිවලට අනුකූලව නිස්සරණධ්‍යාශයෙන් සේවය කරන බවටත්, මාගේ සාමාජිකත්වය හා විනය පිළිබඳ සියලුම ප්‍රශ්නවල දී වැඩිහිටි මණ්ඩලයේ සහ විධායක මණ්ඩලයේ තීරණ අවසාන තීරණ වශයෙන් පිළිගන්නා බවටත් මෙයින් ප්‍රතිඥා දෙමි. තව ද සංගමයේ නීති රීති අනුව මාගේ සාමාජිකත්වය යම් විටක දී මට අහිමි වුයේ නම් ඒ හේතුවෙන් මට කිසිම පෞද්ගලික හානියක් සිදුවුයේ යයි නොසලකන අතර, සංගමයේ සාමාජිකත්වයෙන් අස් කරනු ලබන කිසිවකුට එම අස් කිරීම පෞද්ගලිකව ඔහුට කැළලක් වන දෙයක් සේ නොපිළිගැනීමටත් ප්‍රතිඥා දෙමි. මා අතින් සිදු වූ ප්‍රමාද දෝෂ හා ප්‍රතිපත්ති පැහැර හැරීම ආදී දුර්වලකම්වලින් මිදී නැවත යම් දිනයක සාමාජිකත්වය ලබා ගැනීමට සුදුස්සකු වීමට ද ප්‍රතිඥා දෙමි.

8 වන රීතිය - සාමාජිකත්වය :

(1) වයස අවුරුදු 16 ට අඩු නොවන්නා වූ ද, සංගමයේ ප්‍රතිපත්ති, පරමාර්ථ හා ප්‍රතිඥාව පිළිගෙන ඒ අනුව ක්‍රියා කිරීමට එකඟවන්නා වූ ද, යම් තැනැත්තකු විධායක මණ්ඩලය විසින් සාමාජිකයකු ලෙස බඳවා ගනු ලබන තෙක් 20 වන රීතියේ සඳහන් යම් හවුලක සාමාජිකයකු වශයෙන් පළමු කොට සිටිය යුතු ය.

*(1අ)* (123 වන අධිකාරය වූ) සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කර ඇති යම් සර්වෝදය ශ්‍රමදාන සමිතියකට, සර්වෝදය සමිතියකට/ සර්වෝදය සංසදයකට එකී ආඥාපනතේ විධිවිධාන යටතේ එම සමිතිය/සංසදය අවසන් කරනු ලබන තෙක්, විසුරුවා හරිනු ලබන තෙක් හෝ ගණන් බේරා වසා දමනු ලබන තෙක් සංගමයේ සංස්ථා සාමාජිකයකු විය හැක.

(2) 20 වන රීතියේ සඳහන් යම් හවුලක සාමාජිකයකුට හෝ විධායක මණ්ඩලයේ මතය අනුව ව්‍යාපාරයට වැදගත් සේවයක් ඉටු කර ඇති යම් තැනැත්තකුට හෝ සංගමයේ සාමාජිකයකු වීමට ආරාධනා කිරීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

(3) සාමාජිකත්වය සඳහා නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම් පත්‍රය, දායක මුදල සමග ප්‍රධාන ලේකම්වරයාට ලැබුණු විට ඒ ඉල්ලුම්කරුට සාමාජිකත්වය දීම විධායක මණ්ඩලය විසින් සලකා බලනු ලැබිය යුතු ය

(4) සංගමයේ සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය දීම ප්‍රතික්ෂේප කිරීම, සාමාජිකත්වය අත් හිටුවීම සහ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සියලු බලතල විධායක මණ්ඩලයට ඇත්තේ ය.

(5) සාමාජිකත්වය පිළිබඳ විනයානුකූල කටයුතුවලට අදාළ කරුණුවල දී වාර්ෂික මහා සභා රැස්වීමට හෝ වෙනත් යම් පාර්ශ්වයකට හෝ තැනැත්තකුට හෝ ඒ කටයුතු පිළිබඳව හේතු දැක්වීමට විධායක මණ්ඩලය බැඳී නොමැති නමුදු විධායක මණ්ඩලය විසින් ඒ තීරණ ස්ථිර කරනු ලැබීම සඳහා, මහා සභා රැස්වීම ඉදිරියෙහි තැබිය යුතු ය.

(6) සාමාජිකත්වයේ ශ්‍රේණි හතක් ඇත. එනම්, යොවුන් සාමාජිකයන්, සාමාන්‍ය සාමාජිකයන් , සම්පත් දායක සාමාජිකයන්, යාවජීව සාමාජිකයන්, ගරු සාමාජිකයන්, ජාත්‍යන්තර සාමාජිකයන් සහ සංස්ථා සාමාජිකයන් යනුවෙනි.

"යොවුන් සාමාජිකයන්" යන්නෙන්, වයස අවුරුදු 16 සම්පූර්ණ කර ඇති නමුත්, වයස අවුරුදු 25 සම්පූර්ණ කර නොමැති තැනැත්තන් අදහස් වේ.

"සාමාන්‍ය සාමාජිකයන්" යන්නෙන්, වයස අවුරුදු 25 ට වැඩි තැනැත්තන් අදහස් වේ.

"සම්පත් දායක සාමාජිකයන්" යන්නෙන්, මෙහි 9 වන රීතිය යටතේ නියම කර ඇති සාමාජික ගාස්තුව හෝ ඊට වැඩි යම් සම්මාදම් මුදලක් වාර්ෂිකව ප්‍රදානය කරන තැනැත්තන් අදහස් වේ.

"යාවජීව සාමාජිකයන්" යන්නෙන්, ඒ සාමාජිකත්වය සඳහා මෙහි 9 වන රීතිය යටතේ නියම කර ඇති මුදල දානය කරන තැනැත්තන් අදහස් වේ.

"ගරු සාමාජිකයන්" යන්නෙන් යම් ආගමික නිකායකට අයත් වන්නා වූ ද, විධායක මණ්ඩලයේ මතය අනුව ඔවුන්ගේ ශ්‍රේෂ්ඨත්වයේ හේතුවෙන් සාමාජිකත්වය සඳහා සුදුසුකම් ලබන්නා වූ ද තැනැත්තන් අදහස් වේ.

"ජාත්‍යන්තර සාමාජිකයන්" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ම පදිංචිව නොසිටිය ද, සර්වෝදය චින්තාවලියට දායකව ඇත්තා වූ ද, එතෙර සිට ව්‍යාපාරයට සේවය සලසා ඇත්තා වූ ද, සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීමට විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවා වූ ද, තැනැත්තන් අදහස් වේ.

"සංස්ථා සාමාජිකයන්" යන්නෙන්, (123 වන අධිකාරය වූ) සමිති ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද ඕනෑම සර්වෝදය ශ්‍රමදාන සමිතියක්/සර්වෝදය සමිතියක්/සර්වෝදය සංසදයක් අදහස් වේ.

**9 වන රීතිය - සාමාජික ගාස්තු :**

(1) යොවුන් සාමාජිකයන් වර්ෂයක් පාසා රුපියල් පහක දායක මුදලක් ද, සාමාන්‍ය සාමාජිකයන් වර්ෂයක් පාසා රුපියල් පහළොවක වාර්ෂික දායක මුදලක් ද, ගෙවිය යුතු ය.

(2) සම්පත් දායක සාමාජිකයන් රුපියල් පනහක් හෝ ඔවුන් කැමැති ඊට වැඩි මුදලක් හෝ ස්වකීය වාර්ෂික දායක මුදල වශයෙන් ගෙවිය යුතු ය.

(3) රුපියල් එක් දහසක් එකවර හෝ රුපියල් දෙසීය බැගින් වූ කොටස් පහකින් හෝ ගෙවා සම්පූර්ණ කරන සාමාජිකයන් යාවජීව සාමාජිකයන් වශයෙන් සළකනු ලැබිය යුතු ය.

(4) සාමාජික ගාස්තු ගෙවීමේ බැඳීමක්, ගරු සාමාජිකයන්ට හා ජාත්‍යන්තර සාමාජිකයන්ට නැත්තේ ය.

*(4අ)* සංස්ථා සාමාජිකයන් විසින් වර්ෂයක් පාසා රුපියල් දෙසීයක දායක මුදලක් ගෙවනු ලැබිය යුතු ය.

(5) නියමිත සාමාජික මුදල් එක් එක් අලුත් ලිත් වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවීමෙන් යොවුන්, සාමාන්‍ය, සම්පත්දායක සහ සංස්ථා සාමාජික ශ්‍රේණිවල සාමාජිකයන්ට ස්වකීය සාමාජිකත්වය නව වර්ෂය සඳහා අලුත් කිරීමට සිදු වන්නේ ය.

(6) විධායක මණ්ඩලයේ තීරණයකින් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් හෝ ස්වකීය සාමාජිකත්වය අහිමිකර ගන්නා තැනැත්තන්ට තමන් සාමාජිකයන්ව සිටි කාලය තුළ සංගමයට ගෙවා ඇති යම් දායක මුදලක් හෝ පරිත්‍යාගයක් හෝ ආපසු ලබාගැනීම පිණිස ඉල්ලා සිටීමට හිමිකම නැත්තේ ය.

**10 වන රීතිය - සාමාජික නාම ලේඛනය :**

සාමාජිකයන්ගේ නම්, සාමාජිකත්ව ශ්‍රේණිය, ස්ථිර ලිපිනය, සාමාජිකත්වය දෙන ලද දිනය, සාමාජිකයකු වීම අවසන් කළ දිනය සහ අවශ්‍ය යයි ප්‍රධාන ලේකම්වරයා අදහස් කරන වෙනත් යම් අදාළ තොරතුරු ද දැක්වෙන සාමාජික නාම ලේඛනයක් ප්‍රධාන ලේකම්වරයා විසින් පවත්වා ගෙන යා යුතු ය :

**11 වන රීතිය - වැඩිහිටි මණ්ඩලය :**

(1) වැඩිහිටි මණ්ඩලය සාමාජිකයන් 20 දෙනකු ගෙන් සමන්විත වන්නේ ය. වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයන් සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා ගනු ලැබිය යුතු ය.

(2) සම්පූර්ණ සාමාජික සංඛ්‍යාව වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා ගනු ලැබීමට නොහැකිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් හෝ, වර්ෂය තුළ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා සාමාජිකත්වය අවසන් වීමෙන් හෝ වැඩිහිටි මණ්ඩලයේ ඇතිවන්නා වූ යම් පුරප්පාඩුවක් පිරවීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

(3) සාමාජිකයන්ට හෝ නිලධාරින්ට සම්බන්ධ විනය පිළිබඳ වූ කාරණයක් සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට විධායක මණ්ඩලයට නොහැකි අවස්ථාවක් උද්ගත වූවහොත්, ඒ කාරණය වැඩිහිටි මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එවැනි අවස්ථාවල දී වැඩිහිටි මණ්ඩලය විසින් ගනු ලබන තීරණ සාමාජිකයන් විසින් ද, විධායක මණ්ඩලය විසින් ද, නිලධාරි කමිටුව විසින් ද, එක සමානව අවසානාත්මක ලෙස පිළිගනු ලැබිය යුතු ය.

(4) වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයන් නිල බලයෙන් ම විධායක මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සළකනු ලබන අතර, විධායක මණ්ඩලයේ සෙසු සාමාජිකයන් මෙන් ම ඒ මණ්ඩලයේ රැස්වීම්වලට සහභාගිවීමේ බලය ඔවුන්ට ඇත්තේ ය.

(5) වැඩිහිටි මණ්ඩලය තෝරා ගැනීමෙන් පසු එක්, මාසයක් ඇතුළත ඒ මණ්ඩලය විසින් තම තමන් අතුරින් සභාපතිවරයෙකු හා ලේකම්වරයෙකු පත් කරගනු ලැබිය යුතු ය.

(6) වැඩිහිටි මණ්ඩලයේ යම් සාමාජිකයකු නොපැමිණීමේ හේතුව ලියවිල්ලකින් නොදන්වා විධායක මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණියහොත් සහ විධායක මණ්ඩලයේ ඊළඟ රැස්වීමට පැමිණෙන ලෙස ඉල්ලීමක් කරමින් ප්‍රධාන ලේකම්වරයා විසින් ඒ සාමාජිකයා වෙත විශේෂයෙන් ලියා දැන්වීමෙන් පසුව ද, ඒ සාමාජිකයා ඒ රැස්වීමට නොපැමිණියහොත්, වැඩිහිටි මණ්ඩලයේ ස්වකීය සාමාජිකත්වය ඔහු අතහැර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

12 වන රීතිය - විධායක මණ්ඩලය :

(1) සංගමයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා හා සංගමයේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන, සියලු ප්‍රතිපත්ති තීරණය කිරීමට සහ නිලධාරි කමිටුව මගින් ඒ ප්‍රතිපත්ති හා තීරණ ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය පියවර ගැනීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

(2) විධායක මණ්ඩලය සාමාජිකයන් හැත්තෑපස් දෙනෙකුගෙන් එනම්, වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයන් විසිදෙනාගෙන් ද, සංස්ථා සාමාජිකයන් නොවන සභාපතිවරයා, උප සභාපතිවරුන් අටදෙනා, ප්‍රධාන ලේකම්වරයා, අතිරේක ලේකම්වරුන් තුන්දෙනා හා භාණ්ඩාගාරිකවරයා යන නිලධාරීන් දහහතර දෙනාගෙන් ද, වාර්ෂික මහා සභා රැස්වීමේ දී ම තෝරා පත්කරගනු ලබන විධායක මණ්ඩලයේ සෙසු සාමාජිකයන් හතලිස් එක් දෙනාගෙන් ද, සමන්විත වන්නේ ය.

(3) විධායක මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවන ලෙස එහි සාමාජිකයන් දහතුන් දෙනකු විසින් ඔවුන්ගේ අත්සන් සහිතව ඉල්ලීමක් කරනු ලැබුවහොත් සහ ඒ ඉල්ලීම පිළිගැනීමට විධායක මණ්ඩලය තීරණය කළහොත් විධායක මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවීමට සභාපතිවරයාට බලය ඇත්තේ ය.

(4) විධායක මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට එක් වරක් හෝ රැස්විය යුතු අතර, රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් විසිපස් දෙනෙකු වන්නේ ය.

(5) විධායක මණ්ඩලයේ රැස්වීම්වලට පැමිණීමට තමාට නොහැකි බව ලියවිල්ලකින් නොදන්වා විධායක මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණෙන විධායක මණ්ඩලයේ යම් සාමාජිකයකු විධායක මණ්ඩලයේ ස්වකීය සාමාජිකත්වය අත්හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) විධායක මණ්ඩලයේ සාමාජිකයකු විය යුතු යයි, සභාපතිවරයා විසින් සලකනු ලබන්නා වූ ද, එහෙත් 12 (2) වන රීතියෙහි සඳහන් විධායක මණ්ඩලයේ සාමාජික සංඛ්‍යාව හේතුවෙන් ඔහු විධායක මණ්ඩලයට ඇතුළත්කරගනු ලැබිය නොහැකි වූ ද, යම් තැනැත්තකුට විධායක මණ්ඩලයේ රැස්වීම්වලට ආරාධිත සභිකයකු ලෙස සහභාගි වන ලෙස සභාපතිවරයා විසින් ප්‍රධාන ලේකම්වරයා මාර්ගයෙන් ආරාධනා කරනු ලැබිය හැකිය. ඒ තැනැත්තාට විධායක මණ්ඩලයේ කටයුතුවලට සහභාගිවීමට සම්පූර්ණ අයිතිවාසිකම තිබිය යුතු නමුත්, එහි දී ඡන්දය දීමේ අයිතිවාසිකම් නොතිබිය යුතු ය.

(7) සංගමයේ නිලධාරීන් ඇතුළු විධායක මණ්ඩලයේ සියලු සාමාජිකයන් කිසිදු දීමනාවක් නොලබමින් "ගරු" තත්ත්වයකින් සේවය කරන තැනැත්තන් වන නමුත්, කිසියම් නිලවලට පැවරෙන වගකීම් හා රාජකාරිවල වැදගත්කම නිසා ඒ නිලධාරීන්ගෙන් ප්‍රධාන කාර්යාලය තුළ පූර්ණකාලීන සේවයක් ලබා ගත යුතු බව පෙනේ නම් එම නිලධාරීන්ට උචිත හා ප්‍රමාණවත් දීමනා පිරිනැමීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

**13 වන රීතිය - විධායක මණ්ඩලයේ බලතල :**

පහත දැක්වෙන කාර්ය හා වගකීම් ඉටු කිරීම පිණිස ස්වකීය සියලු බලතල ක්‍රියාත්මක කිරීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේය :–

(1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය අත්හිටුවීම හා සාමාජිකයන් නෙරපා හැරීම ;

(2) සංගමයේ විධායක අධ්‍යක්ෂවරයා පත් කිරීම හා ඔහු ධුරයෙන් ඉවත් කිරීම ;

(3) විධායක අධ්‍යක්ෂවරයාගේ, සහකාර විධායක අධ්‍යක්ෂවරයන් ද, පරිපාලන ලේකම්වරයා ද, මුදල් අධ්‍යක්ෂවරයා ද, අංශ භාර අධ්‍යක්ෂවරයන් ද, ක්ෂේත්‍ර අධ්‍යක්ෂවරයන් ද පත් කිරීම, ඔවුන්ගේ කාර්ය පැවරීම හා ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම ;

(4) නිලධාරී කමිටුවේ කාර්ය අතුරින් මේ රීතිවල සඳහන් කර නොමැති කාර්යභාර නියම කිරීම, අවශ්‍ය වන බලතල ඔවුන් වෙත පැවරීම සහ ඒ බලතල ඉවත් කිරීම ;

(5) විධායක මණ්ඩලයේ හා වැඩිහිටි මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සහ මෙහි පහත දැක්වෙන 14 වන රීතියෙහි විධිවිධානවලට යටත්ව නිලධාරී කමිටුවේ පුරප්පාඩු පිරවීම ;

(6) විශේෂ සේවා කාරක සභා, අනුකාරක සභා සහ කෘත්‍යාධිකාරී කාරක සභා පත් කිරීම හා ඒවා විසුරුවා හැරීම සහ අදාළ කාර්ය හා බලතල ඒ කාරක සභාවලට පැවරීම සහ ඒවායින් ඒ කාර්ය හා බලතල ඉවත් කිරීම ;

(7) සංගමයේ සියලු ගිණුම් පරීක්ෂා කිරීම පිණිස හා මහා සභා රැස්වීමට සහ නියමිත ආණ්ඩුවේ ආයතන වෙත යථා පරිදි විගණනය කොට සහතික කරන ලද හා වාර්ෂික ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම පිණිස සුදුසුකම් ලත් විගණකවරයන් පත් කිරීම ;

(8) සංගමයේ පරමාර්ථ අනුව වැඩසටහන් සංවිධානය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව නිලධාරී කමිටුවට උපදෙස් දීම ;

(9) රීතිවල අර්ථ නිරූපණය කිරීම හා රීති පැහැදිලි කිරීම සහ මෙම රීතිවලින් විධිවිධාන සලස්වා නොමැති කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීම ;

(10) රීති සංශෝධනය කිරීම, ප්‍රතිශෝධනය කිරීම හෝ ඉවත් කිරීම අවශ්‍ය වන විට, ඒ කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීම සහ තත් කාර්ය සඳහා කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමක අනුමතය සඳහා ඒවා ඉදිරිපත් කිරීම ;

(11) වාර්ෂික මහා සභා රැස්වීම්, විශේෂ මහා සභා රැස්වීම් හා මහා සභා රැස්වීම් පවත්වනු ලබන දින, වේලාව හා ස්ථාන තීරණය කිරීම ;

(12) තත් කාලයෙහි සංගමය යටතේ පවතින්නා වූ ද, සංගමය විසින් පරිපාලනය කරනු ලබන්නා වූ ද, කිසියම් ආයතනයක්, ව්‍යාපාරයක් හෝ සේවයක් විධායක මණ්ඩලය විසින් නියම කරනු ලබන යම් කොන්දේසිවලට යටත්ව ස්වාධීන ආයතනයක්, ව්‍යාපාරයක් හෝ සේවයක් වශයෙන් විමධ්‍යගත කොට ඒවා පරිපාලනය කිරීමෙහි ලා, පවත්වා ගෙන යාමෙහි ලා හෝ අන්‍යාකාරයකින් වූ සියලු බලතල හා අවශ්‍ය නිශ්චල හා චංචල දේපළ ඒවාට පවරා දීම ;

(13) සංගමයේ ද, එහි සේවකයන්ගේ ද ශුභසිද්ධිය ඇති කරලීම සඳහා විශේෂ රක්ෂණ අරමුදලක් ශ්‍රී ලංකා මහ බැංකුවේ පිහිටුවීම ; සහ

(14) විධායක මණ්ඩල රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන්, කලින් කල –

(අ) ශ්‍රී ලංකාවෙහි හෝ පිටරට යම් ආයතනයකින් හෝ තැනැත්තකු ගෙන් යම් මුදල් ප්‍රමාණ ලබා ගැනීම හෝ ණයට ගැනීම සහ ඒ ණයට ගැනීම සඳහා ඇප වශයෙන් සංගමයේ චංචල හෝ නිශ්චල දෙපළ කිසිවක් උකස් කිරීම හෝ භාරයට තැබීම ද ;

(ආ) සංගමය විසින් ණයට ගන්නා ලද මුදල් කිසිවක් භාර ඔප්පුවක් නැතහොත් ඒ වෙනත් ඇපවීමක් මගින් සුරක්ෂිත කිරීම ද ;

(ඇ) පොරොන්දු නෝට්ටු, විනිමය බිල්පත් හෝ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර ලිවීම, සෑදීම, භාර ගැනීම, පිටසන් කිරීම, ගණුදෙනු කිරීම, වට්ටම් කිරීම සහ ලියා අත්සන් කිරීම ද ;

(ඈ) ස්ථිර, බේරුම් කළ හැකි හෝ ආපසු ගෙවිය යුතු සෑණ පත්‍ර හෝ සෑණ ස්කන්ධ නිකුත් කිරීම ද ;

(ඉ) වෙනත් ස්වභාවයේ වූ ඇප සහ/හෝ අතිරේක ඇප සෑදීම හෝ නිකුත් කිරීම ද ;

කරනු ලැබිය හැකි ය.

**14 වන රීතිය - නිලධාරී කමිටුව** :

(1) පහත සඳහන් නිලධාරීන් දහහතර දෙනාගෙන් සංගමයේ නිලධාරී කමිටුව සමන්විත වන්නේ ය :–

සභාපතිවරයා ;

උප සභාපතිවරුන් අටදෙනා ;

ප්‍රධාන ලේකම්වරයා ;

අතිරේක ලේකම්වරුන් තුන්දෙනා ;

භාණ්ඩාගාරිකවරයා.

(2) විධායක මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ විධායක අධ්‍යක්ෂවරයා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය මගින් නිලධාරි කමිටුව විසින් ක්‍රියාවේ යොදවනු ලැබිය යුතු ය. නිලධාරි කමිටුව ඔවුන්ගේ ක්‍රියා සම්බන්ධයෙන් එක්ව හා වෙන් වෙන්ව විධායක මණ්ඩලයට වගකිව යුතු ය.

(3) සභාපතිවරයා, උප සභාපතිවරු අටදෙනා, ප්‍රධාන ලේකම්වරයා, අතිරේක ලේකම්වරුන් තුන්දෙනා සහ භාණ්ඩාගාරිකවරයා, (1) සාමාජිකත්වයෙන් හෝ ධූරයෙන් ඉල්ලා අස් වූ විට, (2) මියගිය විට (3) උන්මත්තකයකු හෝ සිහිවිකල තැනැත්තකු බවට පත් වූ විට (4) යම් සාපරාධී වරදකට වරදකරු කරනු ලැබූ විට හෝ (5) විධායක මණ්ඩලයේ සාමාජිකයන් අවම වශයෙන් හතලිස් දෙනකු විසින් ඉල්ලා අස්වන ලෙස ලියවිල්ලකින් ඉල්ලා සිටිනු ලැබූ විට ස්වකීය ධූර දැරීම අවසන් වන්නේ ය. එවැනි අවස්ථාවල දී ඒ පුරප්පාඩු පිරවීමට විධායක මණ්ඩලයට බලය ඇති අතර, ඒ පුරප්පාඩු පුරවනු ලැබූ දිනයෙහි සිට ලිත් මාස දෙකකට නොවැඩි කාලයක් ඇතුළත කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමක දී ඒ පත් කිරීම අනුමත කරනු ලැබිය යුතු ය.

(4) කවර හෝ හේතුවක් නිසා විධායක මණ්ඩලයට ක්‍රියා කිරීමට නොහැකි තත්ත්වයක් උද්ගත වුවහොත් දින තිහක් ඇතුළත විශේෂ මහා සභා රැස්වීමක් කැඳවා අලුත් විධායක මණ්ඩලයක් පත්කර ගන්නා තුරු සංගමයේ කටයුතු නොකඩවා පවත්වා ගෙන යාමේ භාරකාරත්වය නිලධාරි කමිටුව වෙත සාමූහිකව පැවරේ.

(5) (i) නිලධාරි කමිටුව සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් හෝ සභාපතිවරයා කවර හෝ හේතුවක් නිසා පැමිණ නොමැති විටක උප සභාපති වරුන්ගෙන් කෙනකුගේ ප්‍රධානත්වයෙන් යටත් පිරිසෙයින් එක් මසකට වරක් හෝ රැස්විය යුතු ය.

(ii) නිලධාරි කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය, සභාපතිවරයා හා භාණ්ඩාගාරිකවරයා ද ඇතුළුව නිලධාරින් හය දෙනකු විය යුතු ය.

(6) නිලධාරි කමිටුව විසින් එක් එක් මාසය තුළ ගන්නා ලද ප්‍රධාන තීරණ පිළිබඳ වාර්තාවක්, එක් එක් හා සෑම මාසයක් තුළ දී පවත්වනු ලබන විධායක මණ්ඩල රැස්වීමේ දී ප්‍රධාන ලේකම්වරයා හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන නිලධාරියකු හෝ විසින් ඉදිරිපත් කළ යුතු අතර, සංගමයේ වැඩ කටයුතු විධායක අධ්‍යක්ෂවරයා විසින් සංවිධානය කොට ක්‍රියාත්මක කරන ලද අන්දම පිළිබඳ වාර්තාවක් සෑම මාස තුනකට ම වරක් විධායක අධ්‍යක්ෂවරයා විසින් විධායක මණ්ඩලයේ රැස්වීමකට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**15 වන රීතිය - නිලධාරි කමිටුවේ බලතල :**

මේ රීතිවල අන් තැනක දැක්වෙන නිලධාරින්ගේ බලතලවලට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල කාර්ය හා කටයුතු විධායක මණ්ඩලය වෙනුවෙන් හා විධායක මණ්ඩලය අනු දක්නා ලද ප්‍රතිපත්තිවලට හා තීරණවලට යටත්ව නිලධාරි කමිටුව විසින් ම හෝ සර්වෝදය පූර්ණකාලීන සේවකයන් සංවිධාන සහ ආයතන මගින් හෝ ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හෝ කිරීමට නිලධාරි කමිටුවට බලය ඇත්තේය :–

(1) විධායක මණ්ඩලයේ සාමාජිකයන් හෝ නිලධාරීන් හෝ හැර වෙනත් සියලුම පූර්ණකාලීන සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ කාර්ය වෙන් කර දීම, ඔවුන්ගේ විනය පාලනය, සේවය අත්හිටුවීම හෝ සේවයෙන් ඉවත් කිරීම පිළිබඳව සභාපතිවරයාට උපදෙස් දීම ;

(2) කාර්යාල, ආයතන, ග්‍රාමීය ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක හා ජාත්‍යන්තර මට්ටමේ කාර්ය සඳහා, සංවිධායකයන් හා සේවකයන් පත් කිරීම, ඔවුන්ගේ කාර්ය වෙන් කර දීම, ඔවුන් පාලනය කිරීම හා ඉවත් කිරීම ;

(3) අවශ්‍ය විටක, සේවකයන් හා සංවිධායකයන් නඩත්තු කිරීම පිණිස දීමනා සහ ගෙවීම් අනුමත කිරීම ;

(4) සර්වෝදය ශ්‍රමදාන සමිති, සර්වෝදය ගොවි හවුල, සර්වෝදය සිසු හවුල, සර්වෝදය ගුරු හවුල, සර්වෝදය මව් හවුල, සර්වෝදය වෙළෙඳ හවුල, සර්වෝදය සිහිති හවුල, සර්වෝදය පෙර රැකියා සේවය, සර්වෝදය සම්මා ආජීව සේවය, සර්වෝදය දේශෝදය මණ්ඩලය සහ වෙනත් අවශ්‍ය සර්වෝදය මණ්ඩල සංවිධානය කිරීම, පිහිටුවීම හා අධීක්ෂණය කිරීම් සහ ඒ සඳහා සංවිධායකයන් හා සංවිධායක කමිටු පත් කිරීම හා ඉවත් කිරීම ;

(5) සංගමයේ අවශ්‍යතා අනුව, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා වෙනත් ආණ්ඩුවේ ආයතන සමග සම්බන්ධතා ඇති කර ගැනීම ;

(6) සංගමයේ අවශ්‍යතා අනුව, දේශීය හා විදේශීය දෙවර්ගයේ ම සමාන සංවිධාන සමග සම්බන්ධතා ඇති කර ගැනීම හා පවත්වා ගෙන යාම ;

(7) සර්වෝදය ශ්‍රමදාන මධ්‍යස්ථාන, ප්‍රාදේශීය මධ්‍යස්ථාන, දිස්ත්‍රික් මධ්‍යස්ථාන, දිස්ත්‍රික් සංවර්ධන අධ්‍යාපන ආයතන, මධ්‍යම සම්බන්ධීකරණ මධ්‍යස්ථාන, සර්වෝදය ගොවිපලවල්, ආදායම් උපදවන ආයතන, විශේෂ පුහුණු මධ්‍යස්ථාන, ශුභ සාධක නිවාස හා අධ්‍යාපනික ආයතන පිහිටුවීම, ඒවා පාලනය කිරීම හා විසුරුවා හැරීම ;

(8) සංගමය සතු සියලු චංචල හා නිශ්චල දේපළවල භාරකාරත්වය දැරීම, ඒවා පාලනය කිරීම, ඒවායෙන් නිසි ප්‍රයෝජන ගැනීම, දියුණු කිරීම හා ඒවාට යමක් එකතු කිරීම සහ හැකි අවස්ථාවල දී ඒවායින් ආදායම් ලබා ගැනීම ;

(9) සංගමයේ ප්‍රයෝජනය සඳහා ඉඩම්, ගොඩනැගිලි උපකරණ හෝ මුදල් පරිත්‍යාග වශයෙන් හෝ වෙනත් සුදුසු ක්‍රමවලින් භාර ගැනීම සහ සංගමයේ පරමාර්ථ උදෙසා ඒවා උපයෝගී කර ගැනීම හා ආයෝජනය කිරීම ;

(10) සංගමයේ සියලු ලියකියවිලි පවත්වා ගෙන යාම හා ඒවා ආරක්ෂා භාරයෙහි තබා ගැනීම ;

(11) සංගමයේ ආදායම් හා වියදම් පිළිබඳව නිසි ගිණුම් පවත්වා ගෙන යාම හා ඒවා ආරක්ෂා භාරයෙහි තබා ගැනීම ;

(12) සංගමයේ ප්‍රධාන කාර්යාලය හා ශාඛා කාර්යාල පිහිටුවීම, ඒවා පාලනය කිරීම හා පවත්වා ගෙන යාම ;

(13) ශ්‍රමදාන කඳවුරු, ශාන්ති සේනා කඳවුරු, අධ්‍යාත්මික සහෝදරත්ව කඳවුරු, සදාචාර සංරක්ෂණ කඳවුරු, ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සහ සමාජ ශුභ සාධක යෝජනා ක්‍රම සංවිධානය කිරීම, ඒ සම්බන්ධයෙන් වගකීම ;

(14) උපදෙස්, ශ්‍රමදාන, උපකරණ හෝ මුදලින් ආධාර වශයෙන් සංගමයේ ආධාර ඉල්ලා සිටිනු ලැබූ විට, පුද්ගලයන්ට, පවුල්වලට, කණ්ඩායම්වලට, ගම්වලට හෝ ආයතනවලට ආධාර සැපයීම ;

(15) ශ්‍රී ලංකාව ඇතුළත හා විදේශයන්හි අධ්‍යාපන චාරිකා, ශිෂ්‍යත්ව හා පුහුණු කිරීමේ පහසුතා සංගමයේ හා රටේ ජනතාවගේ යහපත සඳහා වන විට ඒවා සංවිධානය කිරීමට සංගමයේ සාමාජිකයන්ට හා වෙනත් සුදුසු තැනැත්තන්ට ආධාර කිරීම ;

(16) ජාත්‍යන්තර, ජාතික, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය, ග්‍රාමීය හා ආයතනික මට්ටමින් දේශන, සාකච්ඡා මාලා සම්මන්ත්‍රණ හා සම්මේලන සංවිධානය කිරීම ;

(17) සර්වෝදය හා ඊට අදාළ විෂයයන් පිළිබඳව පොත් පත්, සඟරා, ප්‍රවෘත්ති පත්‍ර හා වෙනත් පත්‍ර හා වෙනත් ලිපි ලේඛන මුද්‍රණය කර පළ කිරීම ;

(18) මේ රීතිවල දක්වා නොමැති නමුත් සංගමයේ පරමාර්ථ, ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙලවල් වලට අනුකූල වන්නා වූ ද, පක්ෂ හා බලකාමී දේශපාලන කටයුතු වලින් දැඩි ලෙස තොරව ඇත්තා වූ ද, සමාජ ප්‍රතිසංවිධාන කටයුතුවලට සහභාගී වීම ;

(19) සංගමයේ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය වන පහසුතා ඇති කිරීම.

(20) සභාපතිවරයා :

(අ) (i) සභාපතිවරයා විසින් සංගමයේ පරමාර්ථ හා ප්‍රතිපත්ති අනුව ක්‍රියා කරනු ලැබිය යුතු අතර, අන්‍යයන් ද එසේ කරන බවට වග බලා ගත යුතු ය ;

(ii) විධායක මණ්ඩලයේ තීරණ මහ සභාව ඉදිරියෙහි තැබිය යුතු ය ;

(iii) සංගමයේ සියලු කටයුතු සහ විධායක අධ්‍යක්ෂවරයාගේ කාර්ය අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම කළ යුතු ය ; තව ද

(iv) මහා සභාවේ, විධායක මණ්ඩලයේ හා නිලධාරි කමිටුවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය.

(ආ) සභාපතිවරයා නොමැති විටක උප සභාපතිවරුන්ගෙන් කෙනකු විසින් හෝ සභාපතිවරයා හා උප සභාපතිවරුන්ගෙන් කිසිවකු නොමැති විටක වැඩිහිටි මණ්ඩලයෙන් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු විසින් හෝ මහා සභාවේ හා විධායක මණ්ඩලයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, ඒ රැස්වීම්වල කටයුතු කර ගෙන යා යුතු ය.

(ඇ) සභාපතිවරයා විසින් නිලධාරි කමිටුවේ උපදෙස් අනුව පූර්ණ කාලීන සේවකයන් පත් කිරීම හෝ උසස් කිරීම, සේවයෙන් ඉවත් කිරීම හෝ ඔවුන් සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් කටයුතු කිරීම කළ යුතු ය.

(21) ප්‍රධාන ලේකම්වරයා :

ප්‍රධාන ලේකම්වරයා සංගමයේ ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ ය. විධායක මණ්ඩලය විසින් ඔහු වෙත පවරනු ලබන බලතල හා කාර්ය ඔහුට ඇත්තේ ය. මහා සභා රැස්වීම් හා විධායක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, සංගමය වෙනුවෙන් ලියකියවිලිවලට අත්සන් තැබීම අතිරේක ලේකම්වරුන්ට භාර දී ඇති වැඩ සම්බන්ධයෙන් වගකීම හා අවශ්‍ය කටයුතු කිරීම සඳහා නිලධාරි කමිටුවට හා විධායක මණ්ඩලයට දැන්වීම සහ රැස්වීමක වාර්තා තබා ගැනීම හා සංගමයේ ලිපි ලේඛන ආරක්ෂා කිරීම ඔහු වෙත පැවරෙන විශේෂ කාර්ය වන්නේ ය.

(22) භාණ්ඩාගාරිකවරයා :

විධායක මණ්ඩලයේ සහ නිලධාරි කමිටුවේ නියමයන්ට යටත්ව සංගමයට අයත් සියලු ම මුදල් එකතු කිරීම, ඒවායේ ආරක්ෂා භාරය සහ ඒවා විය පැහැදම් කිරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාරිකවරයා වගකිව යුතු වන්නේ ය. ලැබී ඇති හා වියදම් කර ඇති සියළු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙනයාම, ලැබී ඇති හා බැහැර කරන සියලු උපකරණ හා දේපළ පිළිබඳව දේපළ ලැයිස්තු හා ලිපි ලේඛන තබා ගැනීම සහ බැරකම් පිළිබඳ සටහන් තබා ගැනීම ඔහු විසින් කළ යුතු අතර, ඒ ගිණුම් පොත්, ලදුපත් හා ලිපිලේඛන ඉල්ලා සිටිනු ලැබූ විට විධායක මණ්ඩලයට හෝ නිලධාරි කමිටුවට හෝ ඒවා ලබා ගැනීමට සැලැස්විය යුතු ය.

(23) විධායක අධ්‍යක්ෂවරයා :

(අ) විධායක අධ්‍යක්ෂවරයකු ද, විධායක සහායකයන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් ද, මුදල් අධ්‍යක්ෂවරයකු ද, පරිපාලන ලේකම්වරයකු ද, විවිධ අංශ හා ක්ෂේත්‍ර වැඩ කටයුතු භාර අධ්‍යක්ෂවරයන් ද, විධායක මණ්ඩලය විසින් පත් කර ගනු ලැබිය යුතු ය. ස්වකීය කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය යයි තමා සලකන වෙනත් යම් නිලධාරින් විධායක අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම පිට, විධායක මණ්ඩලය විසින් පත් කර ගනු ලැබිය හැකි ය.

(ආ) නිලධාරි කමිටුව විසින් තමා වෙත පවරන ලද, වෙන්කර දෙන ලද, නියම කරන ලද හෝ අනුයෝජනය කරන ලද බලතල, කර්තව්‍ය හා කාර්ය, විධායක අධ්‍යක්ෂවරයා විසින් විධායක මණ්ඩලයේ අනුමතයට යටත්ව, ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(ඇ) විධායක මණ්ඩලයේ හා නිලධාරි කමිටුවේ සියලු රැස්වීම්වලට විධායක අධ්‍යක්ෂවරයා සහභාගී විය යුතු අතර, තමාගේ සියලු ක්‍රියා සම්බන්ධයෙන් සභාපතිවරයා මගින් ඔහු නිලධාරි කමිටුවට වග කිව යුතු ය.

**16 වන රීතිය - මහා සභා රැස්වීම් :**

(1) සියලු ම මහා සභා රැස්වීම් සෑම ශ්‍රේණියක ම සාමාජිකයන්ට විවෘත විය යුතු අතර, කවර හෝ මහා සභා රැස්වීමක් පැවැත්වීම සඳහා ගණපූරණය සාමාජිකයන් හැත්තෑ පස් දෙනකු වන්නේ ය.

(2) වාර්ෂික මහා සභාව, එක් එක් වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනට පෙර විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් දිනයක පවත්වනු ලැබිය යුතු ය.

(3) වාර්ෂික මහා සභා රැස්වීමක් සඳහා යටත් පිරිසෙයින් දින දහ හතරකට පෙර දැනුම් දීමක් සාමාජිකයන් වෙත කළ යුතු ය.

(4) නොවැළැක්විය හැකි හේතු නිසා වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය නොහැකි අවස්ථාවක, එකී රැස්වීම පැවැත්වීම සඳහා නියම කරන ලද දිනයෙහි සිට ඒක මාසයක නොඉක්මවන දිනයකට ඒ රැස්වීම කල් තැබීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

(5) ප්‍රධාන නිලධාරීන් දහහතර දෙනා ද, වැඩිහිටි මණ්ඩලය හා සෙසු විධායක සභිකයන් ද, වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත්කර ගනු ලැබිය යුතු ය.

(6) වාර්ෂික මහා සභා රැස්වීමේ දී, අනුමත විගණකවරයන් විසින් යථා පරිදි විගණනය කරන ලද ඉකුත් වර්ෂ සඳහා වූ ගිණුම් ප්‍රකාශය භාණ්ඩාගාරිකවරයා විසින් ද, වාර්ෂික සේවා වාර්තාව හා ඉකුත් වර්ෂයෙහි වාර්ෂික රැස්වීමේ වාර්තාව ප්‍රධාන ලේකම්වරයා විසින් ද, විධායක මණ්ඩලයේ අනුමතය ඇතිව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(7) සභාපතිවරයාගේ නියමයෙන් හෝ වැඩිහිටි මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් අඩුම වශයෙන් සාමාජිකයන් දහදෙනකු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත හෝ විධායක මණ්ඩලය විසින් හෝ විශේෂ මහා සභා රැස්වීමක් කැඳවිය යුතු යයි තීරණය කරනු ලැබූ විට හෝ සාමාජිකයන් හැත්තෑපස් දෙනකු නැතහොත් සංගමයේ සාමාජිකත්වයෙන් පහෙන් එක් කොටසක් යන මේ සාමාජික සංඛ්‍යා දෙකින් වඩා අඩු සාමාජික සංඛ්‍යාව විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට හෝ 14 (6) වන රීතියෙහි සඳහන් කර ඇති අවස්ථාවේ දී හෝ ප්‍රධාන ලේකම්වරයා විසින් විශේෂ මහා සභා රැස්වීමක් කැඳවනු ලැබිය යුතුය. ඒ ඉල්ලීම කරන ලද දිනය හා ඒ විශේෂ මහා සභා රැස්වීම කැඳවනු ලබන දිනය හා අතර වූ කාලසීමාව එක් මාසයකට වැඩි නොවිය යුතු ය.

(8) කවර හෝ මහා සභා රැස්වීමකට ඉදිරිපත් කිරීමට සාමාජිකයක් විසින් අපේක්ෂා කරනු ලබන යෝජනා කිසිවක් ඒ රැස්වීම පැවැත්වීමට යටත් පිරිසෙයින් දින දහ හතරකටවත් කලින් ප්‍රධාන ලේකම්වරයා මගින් විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ ඉදිරිපත් කරන ලද ඒ යෝජනා අතුරින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා තෝරා ගනු ලැබිය හැකි යෝජනා සම්බන්ධයෙන් තීරණය කිරීමට විධායක මණ්ඩලයට අයිතිවාසිකම ඇත්තේ ය.

(9) සංගමයේ කටයුතු හා සම්බන්ධ සියලු කාරණා පිළිබඳ ඒකච්ඡන්දයෙන් තීරණවලට එළඹීම සංගමයේ සාමාජිකයන් අතර වූ සර්වෝදය සම්ප්‍රදාය වුව ද, විශේෂ අවස්ථාවල දී බහුතර ඡන්දයෙන් තීරණවලට එළඹිය හැකි ය. ගරු හා යාවජීව සාමාජිකයන් වෙත සහ ඒ මහා සභා රැස්වීම පවත්වනු ලබන දිනය තෙක් ස්වකීය සාමාජික මුදල් හිඟ නොමැතිව ගෙවා ඇති යොවුන්, සාමාන්‍ය, සම්පත්දායක, සංස්ථා සාමාජික ශ්‍රේණිවල සාමාජිකයන් වෙත පමණක් ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය පැවරෙන්නේ ය.

17 වන රීතිය - අරමුදල් පාලනය :

(1) සාමාජික මුදල්, දේශීය හෝ විදේශීය පෞද්ගලික ආයතනවලින් හා තැනැත්තන්ගෙන් ලැබෙන පරිත්‍යාග, ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් හෝ විදේශීය ආණ්ඩුවකින් හෝ ආයතනයකින් ලැබෙන ප්‍රදාන හෝ පරිත්‍යාග හෝ දේශීය වූ හෝ විදේශීය වූ හෝ යම් ප්‍රභවයකින් ලැබෙන ණය මුදල් හා සංගමයට අයත් නිශ්චල හා චංචල දේපළවලින් සහ ඉපැයීම්වලින් ලැබෙන ආදායම සංගමයේ අරමුදල් වශයෙන් සලකනු ලබන්නේ ය.

(2) ඒ සියලු මුදල් භාර ගැනීමේ, ඒවායෙහි භාරකාරත්වය දැරීමේ හා ඒවා විය පැහැදම් කිරීමේ වගකීම, විධායක මණ්ඩලයේ හා නිලධාරි කමිටුවේ විධානයන්ට යටත්ව, භාණ්ඩාගාරිකවරයා වෙත පැවරෙන්නේ ය.

(3) සංගමයට ලැබෙන සියලු ම මුදල් ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන (සංස්ථාපිත) සංගමයේ බැරට විධායක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අනුමත බැංකුවක හෝ බැංකුවල, හෝ යම් ඉතිරි කිරීමේ ගිණුමක, ස්ථිර තැන්පත් ගිණුමක, රක්ෂණ සමාගමක, පිනැන්ස් සමාගමක, හෝ වෙනත් මූල්‍ය ආයතනයක තැන්පත් කරනු ලැබිය යුතු අතර, ඒ මුදල් ආපසු ලබාගැනීම සඳහා වූ චෙක්පත්වලට හෝ වෙනත් නීත්‍යානුකූල ලේඛනයකට,

*(i)* සභාපතිවරයා සහ භාණ්ඩාගාරිකවරයා හෝ මුදල් අධ්‍යක්ෂවරයා : *හෝ*

*(ii)* සභාපතිවරයා සහ උප සභාපතිවරුන්ගෙන් කෙනකු හෝ ප්‍රධාන ලේකම්වරයා : *හෝ*

*(iii)* භාණ්ඩාගාරිකවරයා හෝ මුදල් අධ්‍යක්ෂවරයා සහ උප සභාපතිවරුන්ගෙන් කෙනකු හෝ ප්‍රධාන ලේකම්වරයා : *හෝ*

*(iv)* විධායක අධ්‍යක්ෂවරයා සහ සභාපතිවරයා, භාණ්ඩාගාරිකවරයා, ප්‍රධාන ලේකම්වරයා හෝ මුදල් අධ්‍යක්ෂවරයා යන නිලධාරීන්ගෙන් කෙනකු

විසින් අත්සන් තබනු ලැබිය යුතු ය :

එසේ වුවද සංගමය විසින්, උචිත බලධරයාගේ අනුමතය ඇතිව, විදේශීය මුදලින්, අණකරයකින්, තැපැල් මගින් කරනු ලබන පැවරුමකින්, ටෙලිග්‍රාප් මගින් කරනු ලබන පැවරුමකින් හෝ අන්‍යාකාරයකින් ලැබෙන මුදල් කිසිවක් නිර්වාසික විදේශ මුදල් ගිණුමක හෝ විදේශයක යම් බැංකුවක හෝ තැන්පත් කරනු ලැබිය හැකි ය :

එසේම තවදුරටත් එවැනි යම් බැංකුවකින්, රක්ෂණ සමාගමකින්, පිනැන්ස් සමාගමකින්, හෝ වෙනත් මූල්‍ය ආයතනයකින් ඒ බැංකුවේ, රක්ෂණ සමාගමේ, පිනැන්ස් සමාගමේ හෝ වෙනත් මූල්‍ය ආයතනයේ වෙනත් යම් ශාඛාවකට හෝ වෙනත් යම් බැංකුවකට රක්ෂණ සමාගමකට, පිනැන්ස් සමාගමකට, හෝ වෙනත් මූල්‍ය ආයතනයකට යම් මුදල් ප්‍රමාණයක් මාරු කිරීමේ අවශ්‍යතාව පිළිබඳව භාණ්ඩාගාරිකවරයා හෝ මුදල් අධ්‍යක්ෂවරයා විසින් වාර්තා කරනු ලබන අවස්ථාවක, ඒ මාරු කිරීම කරන ලෙස බලය දීමට ද, චෙක්පත් හා වෙනත් නීත්‍යානුකූල ලේඛන අත්සන් කිරීම සඳහා තැනැත්තන් නම් කිරීමට ද, ඒ මුදල් තැන්පත් කිරීමට අදාළව ආඥාවන් කිරීමට ද, විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

(4) සංගමයේ මධ්‍යම කාර්යාලයෙන් බැහැර වූ කටයුතු සම්බන්ධයෙන්, සංගමය විසින් පවත්වා ගෙන යනු ලබන ගිණුම්වලින් චෙක්පත් අත්සන් තැබීමේ අවශ්‍යතාව පැන නැගෙන කවර හෝ විටක, ඒ කාර්ය සඳහා වගකිව යුතු තැනැත්තන් දෙදෙනකු පත් කිරීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

(5) දිස්ත්‍රික්කවල කරගෙනු යනු ලබන ව්‍යාපෘතිවලට අදාළ ගිණුම් විගණනය කිරීමේ අවශ්‍යතාව පැන නැගෙන කවර හෝ විටක, ඒ කාර්ය සඳහා ප්‍රාදේශීය පිළිගත් විගණකවරුන් දෙදෙනකු පත් කිරීමට විධායක මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(6) විගණකවරයන් විසින් යථා පරිදි විගණනය කරනු ලැබ, සහතික කරනු ලැබූ වාර්ෂික ගිණුම් ප්‍රකාශය භාණ්ඩාගාරිකවරයා විසින් විධායක මණ්ඩලයේ අනුමතය ඇතිව වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, විගණකරයන්ගේ වාර්තා සහ එකී වාර්ෂික ගිණුම් ප්‍රකාශය විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම පිණිස තැනැත්තන් තුන් දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් වාර්ෂිකව මහා සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය. එකී වාර්තාවලට හා වාර්ෂික ගිණුම් ප්‍රකාශයට අදාළ සියලු තොරතුරු භාණ්ඩාගාරිකවරයා මගින් ලබා ගැනීමට ඒ කමිටුවට බලය ඇති අතර, ඒ කමිටුව විසින් ඒ මහා සභා රැස්වීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත ඒ පිළිබඳව වූ තම නිර්දේශ අවශ්‍ය කටයුතු සඳහා විධායක මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

18 වන රීතිය - ශාඛා සමිති :

*(1)* කවර හෝ ශ්‍රේණියකට අයත් සංගමයේ සාමාජිකයන් යටත් පිරිසෙයින් පස් දෙනකු සිටින යම් ස්ථානයක ශාඛා සමිතියක් සංවිධානය කිරීමට අවසර දීමට විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

*(2)* සංගමයේ පරමාර්ථ, ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙලට අනුකූලව ශාඛා සමිති කටයුතු කළ යුතු ය.

*(3)* ශාඛා සමිතිවලට අදාළ රීති සම්පාදනය කිරීමට ද, ඒවාට බලතල පැවරීමට ද, ඒවා පාලනය කිරීමට හා විසුරුවා හැරීමට ද, විධායක මණ්ඩලයට බලය ඇත්තේ ය.

**19 වන රීතිය - පිළිගත් සංවිධාන :**

*(1)* සංගමයේ පොදු ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙලවල් හා කටයුතුවල දී එක්ව ක්‍රියා කිරීමට පක්ෂ දේශපාලනය බැඳීමකින් තොර යම් යම් ස්වෙච්ඡා සංවිධාන සංගමයෙන් ඉල්ලා සිටියහොත් ඒ ඉල්ලීම පිළිගෙන ඒ සංවිධාන විසින් සංගමය විසින් පිළිගන්නා ලද සංවිධාන වශයෙන් ලියාපදිංචි කිරීමට නැතහොත් ඒ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට හෝ ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු පිළිගැනීම අවලංගු කිරීමට නිලධාරි කමිටුවට බලය ඇත්තේ ය.

*(2)* එවැනි සංවිධානයක් පිළිගැනීම ඒ සංවිධානයෙහි හෝ සංගමයේ හෝ අනන්‍යතාව කෙරෙහි නැතහොත් ස්වාධීනත්වය කෙරෙහි කවර හෝ ආකාරයකින් බලපෑමක් නොවන්නේ ය.

*(3)* සංගමයේ පිළිගත් සංවිධානයක් ලෙස කරන ලද ඒ ලියාපදිංචි කිරීම ඒක පාක්ෂිකව අවලංගු කිරීමට සංගමයට හෝ ඒ පිළිගත් සංවිධානයට හෝ බලය ඇත්තේ ය.

**20 වන රීතිය - සර්වෝදය හවුල් :**

*(1)* ප්‍රජාවේ විවිධ අංශවලට අයත් තැනැත්තන් අතර සර්වෝදය දර්ශනය ප්‍රචලිත කිරීමේ අදහසින් හා සර්වෝදයේ කටයුතුවලට ඔවුන් සහභාගී කර ගැනීම සඳහා සර්වෝදය හවුල් සංවිධානය කිරීමේ, මෙහෙයවීමේ හා පාලනය කිරීමේ බලය නිලධාරි කමිටුවට ඇත්තේ ය.

*(2)* මෙම හවුල් සර්වෝදය ගොවි හවුල, සර්වෝදය සිසු හවුල, සර්වෝදය ගුරු හවුල, සර්වෝදය කුළහන හවුල, සර්වෝදය වෙළෙඳ හවුල, සර්වෝදය පෙර රැකියා ශ්‍රමදාන සේවය හා සර්වෝදය සිහිති හවුල යන නම්වලින් හඳුන්වනු ලැබිය හැකි ය.

**21 වන රීතිය - නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට ඇති බලය :**

සංගමය විසින් ද සංගමයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. එවැනි අවස්ථාවක දී සභාපතිවරයාට හා ප්‍රධාන ලේකම්වරයාට සංගමය වෙනුවෙන් පෙනී සිටීම සඳහා අවශ්‍ය බලතල ඇති අතර, ඒ බලතල විධායක මණ්ඩලයේ එකඟත්වය ඇතිව විධායක මණ්ඩලයේ වෙනත් සාමාජිකයකුට පැවරීමට ද ඔවුන් ට බලය ඇත්තේ ය.

**22 වන රීතිය - සර්වෝදය මහා සම්මේලනය :**

සංගමයේ සාමාජිකයන්ට, ශාඛා සමිතිවල සාමාජිකයන්ට, පිළිගත් සංවිධානවල නියෝජිතයන්ට, සර්වෝදය හවුල්වල සාමාජිකයන්ට සහ වෙනත් දේශීය හා ජාත්‍යන්තර සංවිධානවල අමුත්තන්ට සහභාගි වන ලෙස ආරාධනා කරනු ලබන දීප ව්‍යාප්ත සර්වෝදය මහා සම්මේලනයක් යටත් පිරිසෙයින් අවුරුදු තුනකට වරක් හෝ විධායක මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබිය යුතු ය.

**23 වන රීතිය - ලියාපදිංචි කළ කාර්යාලය :**

*(1)* සංගමයේ ලියාපදිංචි කළ කාර්යාලය පවත්වා ගෙන යා යුතු ස්ථාන විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

*(2)* සංගමයේ ලියාපදිංචි කළ කාර්යාලය සාමාන්‍යයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටුවිය යුතු නමුත්, ඒ ලියාපදිංචි කළ කාර්යාලය, විධායක මණ්ඩලයේ තීරණයකින් ශ්‍රී ලංකාවේ වෙනත් යම් දිස්ත්‍රික්කයකට මාරු කිරීමේ බලය විධායක මණ්ඩලයට ඇත්තේ ය.

**24 වන රීතිය - රීති සංශෝධනය කිරීම:**

*(1)* සංගමයේ රීති ප්‍රතිශෝධනය කිරීම, පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම හෝ තත්කාර්ය සඳහා කැඳවනු ලබන විශේෂ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් හැර, කරනු නොලැබිය යුතු ය.

*(2)* යෝජිත ප්‍රතිශෝධන, සංශෝධන හා ඉවත් කිරීම් පිළිබඳ ලිඛිත දැන්වීමක් ප්‍රධාන ලේකම්වරයා මගින් විධායක මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, ඒ විශේෂ මහා සභා රැස්වීමේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ප්‍රතිශෝධන, සංශෝධන හා ඉවත් කිරීම් විධායක මණ්ඩලය විසින්, විධායක මණ්ඩලයට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

*(3)* විධායක මණ්ඩලය විසින් අනුමත කරන ලද යම් රීතිවලට කරනු ලැබිය යුතු සංශෝධන, ප්‍රතිශෝධන හා ඉවත් කිරීම් ප්‍රධාන ලේකම්වරයා විසින් හෝ ඔහු පැමිණ නොමැති විටක ඒ රැස්වීමේ මූලාසනය දරන තැනැත්තා විසින් හෝ ඒ විශේෂ මහා සභා රැස්වීමෙහි දී යෝජනා කරනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.